# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

**අංක 2493/61 - 2026 ජුනි මස 19 වැනි සිකුරාදා - 2026.06.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාව

**04 වන සංශෝධනය**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් මස 23 දිනැති අංක 1885/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 ජුනි මස 17 දින.

**I කොටස**

සංශෝධන අංක 01 - 2019 අප්‍රේල් මස 22 වැනි දින හා අංක 2120/2 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2021 නොවැම්බර් මස 24 වැනි දින හා අංක 2255/14 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2025 ජුලි මස 08 වැනි දින හා අංක 2444/21 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*

**II කොටස**

**උපලේඛන 01**

03. එක් එක් කාර්යක්ෂමතා කඩඉම් සඳහාවන ලිඛිත පරීක්ෂණ එම අදාළ මොඩියුල ආවරණයවන සේ පහත පරිදි සකස් විය යුතු ය.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| II පත්‍රය | ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න | පැය 02 | 60 |

EOG 06 - 0249